ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

අවසාන පරීක්ෂණය 2004/2005

විෂයමාලා න්‍යාය හා පරිචය - **ESP 1107**

කාලය - පැය තුනයි.

---

දිනය - 2006.07.23 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30

---

**I** වන කොටසේ සියළුම ප්‍රශ්නවලටත් **II** කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

01. 'විෂයමාලාව' පිළිබඳ ඔබගේ නිර්වචනය දක්වන්න.

02. "සැඟවුණු විෂයමාලාව" යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

03. " විෂයමාලාවක අභිමතාර්ථ, විෂය අන්තර්ගතය සහ ඉගෙනීම, එකිනෙකට ඉතා සමීපව සම්බන්ධ වී ඇත." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

04. විෂයමාලාවක තිරස් සමෝධානය සහ සිරස් සමෝධානය අතර වෙනස පැහැදිලි කරන්න.

05. **CIPP** විෂයමාලා ඇගැයීම් ආකෘතිය පැහැදිලි කරන්න.

06. 1972 දී ශ්‍රී ලංකාවේ යොදාගත් ද්විතියක පාසල් විෂයමාලාවේ කැපී පෙනෙන ගුණාංග තුනක් දක්වන්න.

07. විෂයමාලාව සංවිධානයේදී , අවශ්‍යතා න්‍යායයේ වැදගත්කම කෙටියෙන් සාකච්ඡා කරන්න.

08. සුදුසු උදාහරණයක් දක්වමින් 'හර විෂයමාලාව' යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

**(ලකුණු 5 x 8 = 40)**

## II කොටස

09. i. රූප සටහනක් මගින් ටයිලර්ගේ විෂයමාලා සංවර්ධන ආකෘතිය විස්තර කරන්න. මෙම ආකෘතියේ ප්‍රධාන ගුණාංග පැහැදිලි කරන්න.
(ලකුණු 8 යි.)

ii. ටයිලර්ගේ ආකෘතියේ ප්‍රධාන අඩුලුහුඬුකම් දෙකක් දක්වන්න. (ලකුණු 4 යි.)

iii. වීලර්ගේ විෂයමාලා සංවර්ධන ආකෘතිය මගින් මෙම අඩුලුහුඬුකම් මගහරවා ගැනීමට කොතෙක් දුරට උත්සාහ ගෙන තිබේද යයි පැහැදිලි කරන්න.
(ලකුණු 4 යි.)

10. i. 'සමාජයීය වෙනස්වීම' යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද ?
(ලකුණු 6 යි.)

ii. සමාජයීය වෙනස්වීම්වලට අනුකූලව පාසල් විෂයමාලාව වෙනස් කිරීම අවශ්‍ය වන්නේ කවර හේතූන් නිසාදැයි නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.
(ලකුණු 4 යි.)

iii. සමාජ අවශ්‍යතාවන් ඉටු කිරීම සඳහා පසුගිය දශක දෙක තුළදී, ශ්‍රී ලංකාවේ පාසල් මට්ටමින් කරන ලද විෂයමාලා වෙනස්වීම් සාකච්ඡා කරන්න.
(ලකුණු 6 යි.)

11. පාසල් විෂයමාලාවක් සඳහා විෂය අන්තර්ගතය සහ ඉගෙනුම් අත්දැකීම් තෝරා ගැනීමේදී සැලකිල්ලට ගත යුතු සාධක පැහැදිලි කරන්න. (ලකුණු 20 යි)

12. i. වර්තමාන ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් විෂයමාලාව හෝ ද්විතියික පාසල් විෂයමාලාව පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න.
(ලකුණු 6 යි)

ii. ප්‍රාථමික පාසල් විෂයමාලාව හෝ ද්විතියික පාසල් විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේදී ඔබගේ පාසල අත් විඳින බාධක සාකච්ඡා කරන්න.
(ලකුණු 8 යි.)

iii. මෙම බාධක මගහරවා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සැකෙවින් දක්වන්න. (ලකුණු 6 යි.)

13. පාසල් විෂයමාලාවක් සාර්ථකව ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් පුද්ගලයාගේ භූමිකාව විභාග කරන්න.

i. විදුහල්පතිවරයා
ii. පාසලේ ගුරුවරුන්
iii. සේවාස්ථ උපදේශකවරුන් (ISAS)

(ලකුණු 20 යි.)

14. පහත සඳහන් මාතෘකාවලින් <u>තුනක්</u> තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

i. දැනුම, කුසලතා සහ ආකල්ප වශයෙන් අරමුණු වර්ගීකරණයේ වැදගත්කම.
ii. විෂයමාලා සැලසුම්කරණය සහ සංවර්ධනය කෙරේ දර්ශනයේ බලපෑම.
iii. විෂයමාලා ඇගැයීමේ වැදගත්කම.
iv. පාසල් පාදක තක්සේරුකරණය - එහි වාසි.

(ලකුණු 20 යි)

- හිමිකම් ඇවිරිණි. -